# වයඹ පළාතේ පළාත් සභාවේ
# 2001 අංක 1 දරන
# වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන
# අධිකාරිය - ප්‍රඥප්තිය.

(වයඹ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය : 2001. 10. 23)

වයඹ පළාත තුළ පිහිටි ස්වාභාවික හා වෙනත් සම්පත් පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අරමුණින්, වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය ස්ථාපනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය**

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2001 අංක 1 දරණ "වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය" ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනක සිට ක්‍රියාත්මක වන්නේ ය.

**වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය පිහිටුවීම**

2. මෙම ප්‍රඥප්තියේ මින්මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන "වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය" මෙයින් පිහිටුවනු ලැබේ.

**අධිකාරිය සංස්ථාපිත ආයතනයක් වීම**

3. ඉහත දෙවන වගන්තියේ අධිකාරියට දී ඇති නාමයෙන් එම අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත ආයතනයක් විය යුතු අතර, එම නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද, අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

**වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ පරමාර්ථ**

4. පළාත තුළ පිහිටි සම්පත් පිළිබඳව ජනතාව අතර දැනුම හා අවබෝධය වර්ධනය කිරීම, එකී සම්පත් සංරක්ෂණය කිරීම පිළිබඳ උපාය මාර්ග ජනතාව අතර ප්‍රචලිත කිරීම, ඒ සඳහා අවශ්‍ය වන ආයතන, උපදේශක සේවා ඇතුළු අදාළ වන පහසුකම් සැලැස්වීම, අධිකාරිය පිහිටුවීමේ පරමාර්ථය වන්නේ ය.

**අධිකාරියේ බලතල හා කාර්යයන්**

5. අධිකාරියේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් බලතල හා කාර්යයන් ඉටුකළ හැකි වන්නේ ය.

(අ) සම්පත් ධාරණිය මට්ටමින් සංවර්ධනය කිරීමට, අධ්‍යයනය කිරීමට අදාල වන පරිදි අවශ්‍ය උද්‍යාන, මත්ස්‍ය කෞතුකාගාර හා මත්ස්‍ය ප්‍රදර්ශනාගාර ආදිය සංවිධානය කිරීම, කළමණාකරණය කිරීම හා පවත්වාගෙන යෑම.

(ආ) ඉහත උප වගන්ති (අ) හි සඳහන් සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය ඒකක පිහිටුවීම, උපදේශක හා අධ්‍යාපනික සේවාවන් පවත්වාගෙන යාම සහ එකී කාර්යයනට සම්බන්ධ වන සේවාලාභීන්ගේ පොදු පහසුකම් සැපයීම.

(ඇ) මිළදී ගැනීමෙන් හෝ අන් අයුරකින් යම් නිශ්චල හෝ චංචල දේපලක් සන්තකයට ගැනීම හා දැරීම බදු හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, හුවමාරු කිරීම, විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම.

(ඈ) අධිකාරියේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම පිණිස දේශීය සංවිධාන සමග හවුල් ව්‍යාපාර ආරම්භ කිරීම, සේවාවක් ලබා ගැනීම ආදී කටයුතු සඳහා ගිවිසුම් වලට හෝ කොන්ත්‍රාත්තුමය ගිවිසුම්වලට හෝ සහයෝගිතා ගිවිසුම් වලට එළඹීම.

අමාත්‍යවරයාට උපදෙස් දීම

6. ඉහත (4) හා (5) වගන්තිවල සඳහන් යම් කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් හා අදාළ අමාත්‍යවරයා අධිකාරිය වෙත යොමු කරනු ලැබිය හැකි වෙනත් කරුණක් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයාට උපදෙස් දීම අධිකාරිය සතු වගකීම විය යුත්තේ ය.

අධිකාරියේ නියෝජ්‍යායතන

7. ස්වකීය කාර්යයන් හරියාකාරව හා ඵලදායී අයුරින් ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සැළකෙන අංශ හෝ නියෝජ්‍යායතන යම් සංඛ්‍යාවක් අධිකාරිය විසින් පවත්වාගෙන යා හැකි වන්නේ ය.

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

8. (1) මෙම ප්‍රඥප්තියේ මින්මතු මණ්ඩලය යයි හඳුන්වනු ලබන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටිය යුතු අතර, එම මණ්ඩලය නිල සාමාජිකයන් දෙදෙනෙකුගෙන් ද, නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් ද සමන්විත විය යුතු ය.

(2) නිල සාමාජිකයන් දෙදෙනා වයඹ පළාතේ ධීවර විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් සහ වයඹ පළාතේ සංස්කෘතික හෝ පරිසර විෂයය භාර අමාත්‍යාංශ ලේකම්වරුන් අතරින් එක් අයෙකුගෙන් සමන්විත විය යුතු ය.

(3) නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර, එකී සාමාජිකයින් අධිකාරියේ පරමාර්ථ ඉෂ්ඨ කරගැනීම සඳහා දැනුම හා කුසලතාවයන් ඇති අයවළුන් විය යුතු ය.

නුසුදුසුකම්

9. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට සුදුසුකම් නොලබන්නේ ය.

නම් කරනු ලබන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ගේ සාමාජික කාල සීමාව

10. අමාත්‍යවරයා විසින් පහ කරනු ලැබුවහොත් හෝ කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මිස සියළුම නම් කරනු ලබන සාමාජිකයින් අවුරුදු තුනක කාල සීමාවකට තම තනතුරු වල රැඳිය හැකි වේ.

**වැඩ බලන සාමාජිකයන්**

11. අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා සිය ධූරයේ රාජකාරි ඉටු කිරීමට යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වේ නම්, නව වැනි වගන්තියේ නියමයන්ට යටත්ව අමාත්‍යවරයා විසින් එම සාමාජිකයා වෙනුවෙන් කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැක.

**නම් කළ සාමාජිකයින් ඉල්ලා අස්වීම, ඉවත් කිරීම**

12. (1) අමාත්‍යවරයා අමතන ලිපියක් එවා, නම් කළ සාමාජිකයකුට තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) එසේ කිරීම අවස්ථානුකූල යයි අදාළ අමාත්‍යවරයාට හැඟී යන්නේ නම්, නම් කළ සාමාජිකයකු සිය ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

**සාමාජිකයන් නැවත පත් කිරීම**

13. කාලය ඉකුත් වීමෙන් ධූරයෙන් ඉවත් වන සාමාජිකයකු නැවත පත් කරනු ලැබිය හැකි ය.

**මණ්ඩලයේ සභාපති හා උපසභාපති**

14. (1) ධීවර විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් වරයා මණ්ඩලයේ සභාපති විය යුතු අතර, උප සභාපති, මණ්ඩලයේ සාමාජිකයින් අතරින් තෝරාපත් කරගත යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීමකදී යම් කරුණක් පිළිබඳව කැමැත්ත විමසීමේදී පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වේ නම්, සභාපතිවරයාට තම ඡන්දයට අතිරේකව දෙවන ඡන්දයක් නැතහොත් තීරක ඡන්දයක් හිමි වේ.

**මණ්ඩල රැස්වීම්**

15. (1) මණ්ඩලය මසකට අවම වශයෙන් එක් වරක් හෝ රැස්විය යුතු ය.

(2) සභාපති හෝ උප සභාපති අවස්ථානුකූලව මණ්ඩල රැස්වීම් වල මූලාසනය දැරිය යුතු ය.

(3) සෑම මණ්ඩල රැස්වීමක් ම පිළිබඳව ලිඛිත දැන්වීමක් එක් එක් සාමාජිකයකුටම රැස්වීම් දිනට දින 04 කට පෙර ලැබෙන්නට සැලැස්විය යුතු අතර, එම රැස්වීමේ දී කිරීමට නියමිත කාර්යයන් කවරේදැයි නිශ්චිත වශයෙන් එහි සඳහන් විය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීමක් කැඳවන ලෙස අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකු අත්සන් කර ඉදිරිපත් කරන ලිපියක් මගින් ඉල්ලා සිටියහොත්, සභාපතිවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

**මණ්ඩල රැස්වීම් සඳහා ගණපූරණය**

16. මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතු ය.

**මණ්ඩල රැස්වීම් පරිපාටිය**

17. මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිණිස මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට යටත්ව මණ්ඩලය විසින් සිය කාර්ය පරිපාටිය සකස් කරගත හැකි ය.

**මණ්ඩලයේ පුරප්පාඩු නිසා එහි කටයුතු බලරහිත නොවන බව**

18. මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත් කිරීම දෝෂ සහිතවීම යන හේතු නියාම පමණක්, මණ්ඩලයේ යම්කිසි ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ බල රහිත යයි නොසැළකිය යුතු ය.

**මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික**

19. වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව තීරණය කරනු ලබන ආකාරයට හා ප්‍රමාණවලට අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය හැකි ය.

**අධිකාරියේ මුද්‍රාව**

20. (1) අධිකාරියේ පොදු මුද්‍රාව, මණ්ඩලයේ ලේකම් භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිටදී හැර, අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයක හෝ ලේඛනයක හෝ නොයෙදිය යුතු අතර, අදාළ මණ්ඩල සාමාජිකයින් දෙදෙනා ඔවුන් එම අවස්ථාවේ එහි සිටි බවට සළකුණක් වශයෙන් එම සාධන පත්‍රයෙහි නැතහොත් ලේඛනයෙහි තම අත්සන් යෙදිය යුතු ය.

(3) අධිකාරියේ මුද්‍රාව යොදන ලද සාධන පත්‍ර හෝ ලේඛන හෝ පිළිබඳව මණ්ඩලයේ ලේකම් විසින් ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

**අමාත්‍යවරයා විසින් මණ්ඩලයට කරනු ලබන නියමයන්**

21. මණ්ඩලය ස්වකීය බලතල, කාර්යයන් හා වගකීම් ක්‍රියාත්මක කිරීමේදී, ඉටු කිරීමේදී හා කාර්ය සාධනයේ දී අමාත්‍යවරයා විසින් කලින් කලට නිකුත් කළ හැකි පොදු හෝ නිශ්චිත නියමයන්ට මණ්ඩලය යටත්වනවා මෙන්ම, එම නියමයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

**මණ්ඩලය විසින් වගකීම්, කාර්යයන් හා බලතල පැවරීම**

22. (1) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වගකීම්, කාර්යයන් හා බලතල මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකුට හෝ සේවකයකුට මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් කාරක සභා, උප කාරක සභා සහ උපදේශක සභා පත් කරනු ලැබිය හැකි අතර, විශේෂ විෂයයක් හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඕනෑම වගකීමක් හෝ කාර්යයක් හෝ බලයක් හෝ ඒවාට පවරනු ලැබිය හැකි ය.

(3) ඉහත (1) හා (2) උප වගන්ති යටතේ බලතල පවරනු ලැබූ අයෙකු හෝ කණ්ඩායමක් විසින් මණ්ඩලයේ පොදු හෝ නිශ්චිත නියමයනට යටත්ව, තමන් වෙත පැවරනු බලතල, වගකීම් හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(4) මෙම ප්‍රඥප්තියේ අනිකුත් විධි විධානවලට යටත්ව,

(අ) අධිකාරියේ සේවකයින් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම හා ඔවුන්ගේ විනය පාලනය ගැන ක්‍රියා කිරීම.

(ආ) එම කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම.

(ඇ) එම කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි තීරණය කිරීම, මණ්ඩලය විසින් කළ යුතු ය.

අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා

23. (1) අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් මෙම ප්‍රඥප්තියෙහි මින් මතු කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් හඳුන්වනු ලබන පූර්ණ කාලීනව සේවයේ යෙදිය හැකි තැනැත්තකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතු ය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් කළමනාකාර අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු ය.

කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ බලතල හා රාජකාරි

24. (1) කළමනාකාර අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ ලේකම් විය යුතු අතර, මණ්ඩල රැස්වීම් වලදී ඔහුට ඡන්ද බලය හිමි නොවේ.

(2) අධිකාරියේ එදිනෙදා සියළුම පරිපාලන කටයුතු පිළිබඳව කළමනාකාර අධ්‍යක්ෂවරයා වගකිව යුතු වේ. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට යටත්ව,

(අ) අධිකාරිය විසින් සේවයේ යොදවා ගෙන ඇති අයගේ කුසලතා වර්ධනය,

(ආ) අධිකාරියේ කාර්යක්ෂමතාවය හා අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කිරීමෙහිලා, ඵලදායිතාව වැඩි දියුණු කිරීම.

(ඇ) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ සේවාවන් සංවිධානය කිරීම,

(ඈ) මණ්ඩලයේ රැස්වීම් වාර්තා තබාගැනීම, එකී කටයුතු වලට ඇතුළත් විය යුතු ය.

(3) මෙයට අමතරව මණ්ඩලය විසින් කළමනාකාර අධ්‍යක්ෂවරයාට පවරනු ලැබිය හැකි බලතල, කාර්යයන් හා රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

අධිකාරියේ අරමුදල

25. අධිකාරියට අරමුදලක් තිබිය යුතු ය.

(1) වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් අධිකාරිය විසින් පිහිටුවිය යුතු අතර, එය වයඹ පළාත් සභාවේ වෙනම ගිණුමක් වශයෙන් පවත්වා ගත යුතු ය.

(2) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ තුන්වෙනි කොටසේ විධිවිධාන එම අරමුදලට අදාළ විය යුතු ය.

(3) අධිකාරියේ ප්‍රයෝජනය උදෙසා පළාත් සභාව විසින් කලින් කලට ලබා දෙනු ලබන මුදල්, අධිකාරියට පැවරී ඇති බලතල, කාර්යයන් හා රාජකාරි ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී කාර්ය සාධනයේදී අධිකාරියට ලැබෙන සියළු මුදල් හා පරිත්‍යාග අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

අරමුදල යෙදවිය හැකි කරුණු

26. අධිකාරියේ අරමුණු සපුරා ගැනීම පිණිස හෝ මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ පැවරී ඇති බලතල, කාර්යයන්, රාජකාරි ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කාර්ය සාධනයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි අරමුදල යොදා ගත හැකි ය.

අධිකාරියේ ගිණුම්

27. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් සිය ආදායම් හා වියදම් පිළිබඳවත්, වෙනත් සියළු ගණුදෙනු පිළිබඳවත් නිසි පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සම්පාදනය කළයුතු අතර, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකට හා තීරණය කරනු ලබන තොරතුරු ඇතුළත් කොට, සිය ව්‍යාපාරයට අදාළව ගිණුම් හා සංඛ්‍යාලේඛන ඇතුළත් වාර්ෂික ප්‍රකාශයක් පිළියෙළ කළ යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය

28. අධිකාරියේ මුදල් වර්ෂය ජනවාරි මස පළමුවැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වේ.

අධිකාරියේ විගණනය

29. (අ) එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් අධිකාරියේ ගිණුම්, සුදුසුකම් ලත් විගණකවරයෙකු ලවා විගණනය කළ යුතු ය.

(ආ) අධිකාරියේ ගිණුම් විගණනය කිරීමේ කාර්යය උදෙසා ඔහු විසින් දරණ ලද වියදම් පියවීම සඳහා මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික මුදලක් අධිකාරියේ අරමුදලින් ඔහුට ගෙවිය යුතු ය.

(ඇ) මෙම වගන්තියේ කාර්යය උදෙසා සුදුසුකම් ලත් විගණකවරයා යනුවෙන් අදහස් වනුයේ,

I. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු වූද, එම ආයතනය විසින් ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද, තැනැත්තකු හෝ,

II. යම් ගණකාධිකාරී සමාගමක එක් එක් හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් වේ.

විගණන වාර්තාව හා අධිකාරියේ වැඩ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු බව

30. විගණනය කරන ලද ගිණුම් වාර්තාව එක් එක් වර්ෂය වෙනුවෙන් ලද විට, එම වාර්තාවට අදාළ මුදල් වර්ෂය තුළ දී අධිකාරිය විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක් ද සමග එය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළයුතු අතර, ඔහු විසින් එම ගිණුම් වලට අදාළ මුදල් වර්ෂය ඉකුත් වී දොළොස් මසක් ඉකුත් වීමට පෙර එය අමාත්‍ය මණ්ඩලයට හා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට සැළැස්විය යුතු ය.

නියෝග

31. (අ) මෙම ප්‍රඥප්තියේ සිද්ධාන්ත හා විධිවිධාන, නීති ක්‍රියාත්මක කිරීම සඳහා ත්, නියම කළයුතු යයි නැතහොත් නියෝග පැනවිය යුතු යයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් කරුණක් ක්‍රියාත්මක කිරීම සඳහා ත්, අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(ආ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(ඇ) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ගැසට් පත්‍රයේ පලවීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව ඉදිරියේ තැබිය යුතු ය. ඒ අයුරින්ම අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් වෙතොත් එය අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු කළා සේ සැළකිය යුතු වුවත්, එම නියෝග යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියා මාර්ගයන් කෙරෙහි එම අවලංගු වීම බලනොපෑ යුතු ය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් මේ අයුරින් අවලංගු වූවා සේ සැළකිය යුත්තේ කවර දිනකද යන්න දැන්වීමක් මගින් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

රීති

32. රීති සෑදිය යුතු යයි බලය දෙන ලද හෝ මෙම ප්‍රඥප්තිය මගින් නියම කර ඇති හෝ කරුණු වලට අදාළව, අධිකාරිය මගින් රීති සම්පාදනය කළ හැක.

අධිකාරියේ සේවකයින් රාජ්‍ය සේවකයින් ලෙස සැලකීම

33. දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යයන් උදෙසා අධිකාරියේ සියළුම සේවකයන් "රාජ්‍ය සේවකයින්" ලෙස සැලකිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

34. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය

35. මෙම ප්‍රඥප්තියේ අන් ආකාරයකින් සඳහන් වුවහොත් මිස "අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ධීවර විෂයභාර අමාත්‍යවරයා ද,

"අරමුදල" යන්නෙන් වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියේ අරමුදල ද,

"සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

"ස්වාභාවික හා වෙනත් සම්පත්" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සලසා ඇති විධිවිධාන වලට අනුකූලව, 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනතේ හා 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ පනතේ නියමයන්ට පටහැනි නොවන පරිදි හඳුනාගත් සියළුම ජීවී සහ අජීවී සම්පත් ද, ඒවායේ නිපැයුම් සහ මානව සම්පත් ද

අදහස් කෙරේ.